සැ. යු. - 2020.06.03 දින පළ කරන ලද අංක 2283 ගැසට් පත්‍රයේ I:II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,284 - 2022 ජුනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 988 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 993 |

සැ. යු. - (i) පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අන්තරායකර සත්ත්ව (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 17 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කළුතර ප්‍රාදේශීය සභාව

කළුතර ප්‍රාදේශීය සභාවට අයත් වස්කඩුව, නාගොඩ, මොරොන්තුඩුව උප කාර්යාල බල ප්‍රදේශ තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් මාර්ගයන් දක්වා ඇති නාමයන්ගෙන් නාමකරණය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 198 වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් දන්වමි.

සංජීව ආරියරත්න,
සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 04 වැනි දින,
ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 වන පටුමග | 3 m | 44.4 m | 705 බී මාවල | 210/3 හි ආර්.ඩී.සිරිජීව මහතාගේ නිවස සහ අංක 210/5 පිලිප් මැක්ඩොනල්ඩ් මහතාගේ නිවස | ජයන්ති මහත්මියගේ නිවස සහ අංක 210/හි 2 අතපත්තු. ඩී. එස්. මහතාගේ නිවස |
| 2 වන පටුමග | 3 m | 126 m | 705 බී මාවල | අංක 210/A/1 හි එම්.ජයමාන්න මහතාගේ නිවස සහ අංක 210/5 හි සුජිත් ෆොන්සේකා මහතාගේ නිවස | අංක 209/1B/5 හි එම්.ඒ.දිපාල් මහතාගේ නිවස සහ අංක 209Bහි එම්. මහින්ද පෙරේරා මහතාගේ නිවස |
| 3 වන පටුමග | 3 m | 182 m | 705 බී මාවල | අංක 211 හි මොහාන් චානක පෙරේරා මහතාගේ නිවස සහ අංක 209/ A/2 හි ඒ. ජී. නාමල් මහතාගේ නිවස | අංක 209/2/ F හි සැම්සන් අල්විස් මහතාගේ නිවස |
| 4 වන පටුමග | 2.5 m | 56.5 m | 705 බී මාවල | අංක 222 හි ඊ. ඒ. සිරියානන්ද මහතාගේ නිවස සහ අංක ඊ. ඒ. කපිල මහතාගේ නිවස | අංක 212 හි වාසනා කේ. ආර්. මහත්මියගේ නිවස |
| 5 වන පටුමග | 3 m | 180 m | 705 බී මාවල | අංක 229/ A /1 හි දයා පෙරේරා මහතාගේ නිවස | අංක 228/හි 6 තිවංක සිරිමාල් මහතාගේ නිවස සහ 228 අංක/හි 1 ප්‍රනාන්දු ඩබ්. එස්. පී. මහතාගේ නිවස |
| රණවිරු නිමන්ත මනෝරත්න මාවත | 3 m | 0.1 Km | 729 ඒ අළුබෝගහලන්ද | කළුතර, නාගොඩ, සන්දර්ශනාරාම පාර, 218 හි ඩබ්. ජයන්ත මහතාගේ නිවස | කළුතර, නාගොඩ, සන්දර්ශනාරාම පාර, 222/7 හි ඊ. බී. උපාලි මහතාගේ නිවස |

| | | | | | |
|---|---|---|---|---|---|
| සුහද මාවත | 5 m | 400 m | 727 ඩී මහහීනටියන්ගල | කළුතර දකුණ, මහහීනටියන්ගල, අංක 57 ඒ, හේමපාල ජයරත්න පෙරේරා මහතාගේ නිවස | කළුතර දකුණ, මහහීනටියන්ගල, අංක 57 F නන්දන උපුල් කුමාර මහතාගේ නිවස |
| 3 වන පටුමග | 3.65 m | 90 m | 708 පොතුපිටිය උතුර | වටරවුම් පාර | නො 72, චාන්දි නිවස අසලින් අවසන් වන මාර්ගය |
| පළමු පටුමග | 4.5 m | 101 m | 711 පනාපිටිය උතුර | කජුවත්ත මාර්ගය | චන්ද්‍රිකා කරුණාවතී මහත්මියගේ නිවස |
| පොහද්දරමුල්ලේ පේමාලෝක නාහිමි මාවත | අඩි 11 - 12 | අඩි 1049 | 707 පොහද්දරමුල්ල නැගෙනහිර | ගාළු පාර | 359 බී. ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මහතාගේ නිවස |
| රිවර් වීව් රෝඩ් | 3.4 m | 110 m | 723 ඊ පළාතොට | කළුතර පළාතොට ප්‍රධාන මාර්ගය | බන්දූ රිවර් ඉන් හෝටලය අසල |

06 -107/1

---

## කළුතර ප්‍රාදේශීය සභාව

කළුතර ප්‍රාදේශීය සභාවට අයත් නාගොඩ ප්‍රාදේශීය සභා උප කාර්යාලයට අනුබද්ධව පවත්වාගෙන යනු ලබන නාගොඩ මහජන පුස්තකාලය ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 04 දරන වීථි නම් කිරීමේ සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමේ පනත ප්‍රකාරව ''ඇම්. පී. පෙරේරා ගුණානුස්මරණ මහජන පුස්තකාලය'' යනුවෙන් නම් කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මෙයින් දන්වමි.

සංජීව ආරියරත්න,
සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 10 වැනි දින,
ගාළු පාර, වස්කඩුව,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-107/2

## බේරුවල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මාලේවන්බද්ද උපකාර්යාල බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය "රණවිරු ලාන්ස් කෝප්‍රල් එන්. ඩී. අසංක සමීර මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ 2021.08.17 දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක ඊ 1.1 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එම මාර්ගය 2022.04.08 දින සිට "රණවිරු ලාන්ස් කෝප්‍රල් එන්. ඩී. අසංක සමීර මාවත" යනුවෙන් නම්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

බී. ඩබ්. එම්. මේනක විමලරත්න,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2022 මැයි මස 23 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාවේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | - | බේරුවල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | - | කළුතර |
| 3. | ප්‍රා. ලේ. කොට්ඨාසය | - | බේරුවල |
| 4. | දැනට භාවිත වන නම | - | දර්ගානගරය - මාලේවන්ගොඩ මාර්ගයේ යක්වත්ත පාරෙන් ආරම්භ වී හාතාතුඩුවෙන් අවසන්වන මාර්ගය |
| 5. | මාර්ගයේ ආරම්භය | - | දර්ගානගරය - මාලේවන්ගොඩ මාර්ගයේ යක්වත්ත පාරෙන් |
| 6. | මාර්ගයේ අවසානය | - | ආරම්භ වී හාතාතුඩුවෙන් අවසන් වේ. |
| 7. | අලුතින් යොදා ඇති නම | - | "රණවිරු ලාන්ස් කෝප්‍රල් එන්. ඩී. අසංක සමීර මාවත" |

06-126

---

## බේරුවල ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මාලේවන්බද්ද උපකාර්යාල බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ගය "රණවිරු කෝප්‍රල් එම්. වී. කේ. ප්‍රියන්ත මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ 2021.08.17 දින පැවති මාසික සභා රැස්වීමේ දී අංක ඊ. 1.2 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් එම මාර්ගය 2022.04.08 දින සිට "රණවිරු කෝප්‍රල් එම්. වී. කේ. ප්‍රියන්ත මාවත" යනුවෙන් නම්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

බී. ඩබ්. එම්. මේනක විමලරත්න,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2022 මැයි මස 25 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය සභාවේ දී ය.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | - | බේරුවල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | - | කළුතර |
| 3. | ප්‍රා. ලේ. කොට්ඨාසය | - | බේරුවල |
| 4. | දැනට භාවිත වන නම | - | පිංහේන ජනපද මාර්ගය |

| | | | |
|---|---|---|---|
| 5. | මාර්ගයේ ආරම්භය | - | පී. ආර්. ඩී. ඒ. මාර්ගයේ මහකඩේ හන්දියෙන් |
| 6. | මාර්ගයේ අවසානය | - | ත්‍රීඑකර් ෆාම් එක පිහිටි ස්ථානයෙන් |
| 7. | අලුතින් යොදා ඇති නම | - | "රණවිරු කෝප්‍රල් එම්. වී. කේ. ප්‍රියන්ත මාවත" |

06-127

---

**පස්ගොඩ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ පළවන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම 2020.09.15 දිනැති මහ සභා රැස්වීම් වාර්තාවේ තීරණ අංක 05.01 යටතේ සභා සම්මත වී ඇත. ඒ අනුව පහත සඳහන් යෝජනාව ඉහත කී වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල යටතේ අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දම්සර කරුණාජීව ලන්දගේ,<br>
පළාත් පාලන සහකාර කොමසාරිස්,<br>
මාතර.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ පළවන උපවගන්තියෙන් පස්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය *හෙවත්* පහත උපලේඛනයේ ඇතුළත් කර ඇති ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශය වශයෙන් ප්‍රකාශයට පත් කිරීම පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය මත සිදු කිරීම සුදුසු බවට පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති ඊශ්වරගේ මහින්ද වන මා විසින් යෝජනා කරමි.

එකී ප්‍රදේශය :

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* |
|---|---|---|
| දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ (පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) පිහිටියා වූ අංක 249 A උෟරුබොක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසය, අංක 249 කීරිපිටිය නැගෙනහිර, අංක 249 B මැකිලිතැන්න, අංක 249 C හීගොඩ, අංක 246 B ගින්නලිය බටහිර අංක 253 A දම්පහල බටහිර යන ග්‍රාම නිලධාරි කොට්ඨාසන්හි කොටස්වලින් සැදුම්ලත් දෙවැනි තීරුවේ විස්තරවන ඉම් සහ මායිම් වලින් සමන්විත වූ මුළු මහත් ප්‍රදේශය | උතුර : | මාතර කොටපොල මාර්ගයේ මධ්‍ය රේඛාව සහ හසරලිගම මාර්ග යේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂයෙන් (බුළුගහ හන්දිය) ආරම්භ වී ගිණිකොණ දෙසට හසරලිගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඇදි රේඛාව උෟරුබොකු ඔය හරහා ගල්ලැල්ල පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර ගිණිකොන දිශානුගතව ඇදි රේඛාව පින්නකැටිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට ගල්ලැල්ල පාරේ (රතනපාල මාවත) මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට ඇදි රේඛාව උෟරුබොක්ක ඇඹිලිපිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, (පොල්ගස්දෙනිය හන්දිය) එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට ඇදි රේඛාව ධම්මසිද්ධි මාවතේ (කරවිදෙනිය මාර්ගය) මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොණ, ඊසාන දිශානුගතව ඇදි රේඛාව සෙල්ලවත්ත ඇලෙහි මධ්‍ය රේඛාව හමුවන තෙක් ද (අමංගිලිය බෝක්කුව) |
| | නැගෙනහිර : | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එම ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, ගිණිකොන සහ නිරිත දෙසට ඇදි රේඛාව උෟරුබොකු ඔයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට උෟරුබොකු ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට ඇදි රේඛාව උෟරුබොකු ඔය උෟරුබොක්ක කටුවන මාර්ගය හමුවන උමන්දොල පාලමේ මධ්‍ය ලක්ෂ්‍ය දක්වාද, එතැන් සිට උෟරුබොක්ක කටුවන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, වයඹ සහ නිරිත දෙසට ඇදි රේඛාව තැන්නහේන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දෙසට ඇදි රේඛාව උෟරුබොක්ක හුළංකන්ද මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, |

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* |
|---|---|---|
| | දකුණ : | අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව මාතර කොටපොල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, (හීගොඩ මන්සන්ධිය)<br>එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, බටහිර, දකුණු, බටහිර ගිණිකොණ සහ නිරිත දිශානුගතව ඇඳි රේඛාව බොරලම්පොත නව ගම්මාන පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ග යේ මධ්‍ය රේඛාව ඔස්සේ බස්නාහිර දිශානුගතව ඇඳි රේඛාව ගල්ලැනමුල්ල මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, |
| | බටහිර : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, ඊශාන දිශානුගතව ඇඳි රේඛාව දම්බිලිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට දම්බිලිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන වයඹ දෙසට ඇඳි රේඛාව ඌරුබොක්ක කීරිපිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත සහ වයඹ දිශානුගතව ඇඳි රේඛාව දොලමුල්ල පාරේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව සමගි මාවතේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ඇඳි රේඛාව සව්සිරි උයන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට මාර්ග යේ මධ්‍ය රේඛාව ඊසාන දෙසට ඇඳි රේඛාව බේරුබැවුල වත්තේ නැගෙ නහිර මායිම දක්වා ද, එතැන් සිට බේරුබැවුල වත්තේ නැගෙනහිර මායිම ඔස්සේ ඊසාන සහ වයඹ දෙසට ඇඳි රේඛාව මාතර මාතර කොටපොල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ඇඳි රේඛාව ආරම්භක ලක්ෂය හමුවන තෙක් ද වේ. |

06-201

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් 2022.04.06 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ජී. තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 19 වැනි දින,
උඩුනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරනු ලැබූ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2013.06.28 අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දවූ ද මහා නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා/සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක 01 සිට 29 වූ කොටස්වල දැක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උඩුනුවර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

06-208

---

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### අතුරලිය ප්‍රාදේශීය සභාව

බදු කුලී වෙනස් කිරීම සම්බන්ධවයි

අතුරලිය ප්‍රාදේශීය සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය හා බැකෝ ලෝඩර් යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම වෙනුවෙන් පැයකට අය කරනු ලබන ගාස්තුව ද, ට්‍රක් ජල බවුසරය හා ට්‍රැක්ටර් ජල බවුසර සඳහා අය කරනු ලබන ගාස්තුව 2022.03.22 පැවැත්වූ මහ සභා රැස්වීමේ තීරණ අංක 05.01 (xiv) යටතේ පහත පරිදි සංශෝධනය කරන ලදී.

| *යන්ත්‍රය (වාහන)* | *පළමුව පැය එකකට අය කළ ගාස්තුව (රු.)* | *සංශෝධිත නව මුදල (පැයකට) (රු.)* |
|---|---|---|
| 01. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය | 4,500 0 | 5,500 0 |
| 02. බැකෝ ලෝඩර් යන්ත්‍රය | 2,200 0 | 3,200 0 |

| *යන්ත්‍රය (වාහන)* | *එක් වාරයකට අය කළ ගාස්තුව (පැරණි) (රු.)* | *සංශෝධිත නව ගාස්තුව (රු.)* |
|---|---|---|
| 01. ට්‍රක් ජල බවුසර | 2,500 0 | 3,000 0 |
| 02. ට්‍රැක්ටර් ජල බවුසරය | 1,000 0 | 1,500 0 |

ඩබ්. ජී. නිහාල් ද සිල්වා,
සභාපති,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 05 වැනි දින.

06-209

සංශෝධනයයි

## වැල්ලවාය ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වූ ඉල්ලුම්පත් සහතිකපත් ගාස්තු සහ වෙනත් අයකිරීම් මිල සංශෝධනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 (i) ට අනුව වැල්ලවාය ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව වැල්ලවාය ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වන මහ සභාවේ දී අංක 5(vi) යටතේ ගන්නා ලද 2021 නොවැම්බර් මස 26 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2256 *ගැසට්* පත්‍රයේ නිවේදන අංක 11-820/6 හි සඳහන් සේවාවන්ගේ මිළ ගණන් වර්තමානයේ වෙළඳපොළ භාණ්ඩ හා සේවාවල මිළ ගණන් ඉහලයාම හේතුවෙන් යෙදවුම් පිරිවැය පමණක් ආවරණය වන පරිදි මිළ ගණන් සංශෝධනය කිරීම සඳහා 2022.05.26 දින පැවති මහ සභාවේ දී තීරණය කරන ලදී. මෙම නව මිළ සංශෝධනයන් 2022.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ඩී. හරමානිස්,
සභාපති,
වැල්ලවාය ප්‍රාදේශීය සභාව.

2022 මැයි මස 26 වැනි දින,
වැල්ලවාය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ සිදුවන මරණයක් ආදාහනය කිරීම සඳහා ගාස්තුව | 13,000 0 |
| | - බල ප්‍රදේශයෙන් පිටත සිදුවන මරණයක් ආදාහනය කිරීම සඳහා ගාස්තුව | 15,000 0 |
| 02. | බැකෝ යන්ත්‍රයේ සේවා සැපයීම ක්‍රියාකරන පැය 01 ක් සඳහා ගාස්තුව | 4,800 0 |
| | (මීට අමතරව මුදල් අයකරන සෑම පැය 1කට ක්‍රියාකරු හා සහයක දීමනාව රු. 100.00 කි) | |
| 03. | මෝටර් ග්‍රේඩරයේ සේවා සැපයීම බල ප්‍රදේශය තුළ ක්‍රියාකරන පැය 1ක ගාස්තුව | 8,000 0 |
| | - මෝටර් ග්‍රේඩරයේ සේවා සැපයීම බල ප්‍රදේශයෙන් පිටත ක්‍රියාකරන පැය 1ක ගාස්තුව | 9,000 0 |
| | (මීට අමතරව මුදල් අයකරන සෑම පැය 1කට ක්‍රියාකරු හා සහයක දීමනාව රු. 100.00 කි) | |
| 04. | මාර්ගතලනයේ සේවා සැපයීම දින 01 ක් සඳහා ගාස්තුව | 11,000 0 |
| | (යන්ත්‍රය ක්‍රියාකරන මීටර් පැය ගණන සඳහා ඉන්ධන වියදම් හා ප්‍රවාහනය සඳහා වන වියදම් ඉල්ලුම්කරු විසින් වෙනමම ගෙවිය යුතුය. මීට අමතරව ක්‍රියාකරන දින එකකට ක්‍රියාකරු දීමනාව රු. 500 0 ක් ද අය කරනු ලැබේ.) | |
| 05. | ගලිබවුසරයේ සේවා සැපයීම බලප්‍රදේශය තුළ පළමු වාරය සඳහා | 5,000 0 |
| | - අමතර සෑම වාරයක් සඳහාම අයකරන ගාස්තුව | 4,500 0 |
| | - සෑම කි. මී. 01 ක් සඳහාම යාමට හා ඒමට ගාස්තුව | 90 0 |
| | බල ප්‍රදේශයෙන් පිටත ගලි බවුසරයේ සේවා සැපයීම සඳහා ගාස්තුව | 10,000 0 |
| | - සෑම කි. මී. 01 ක් සඳහාම යාමට හා ඒමට ගාස්තුව | 90 0 |
| | (මීට අමතරව ගලිරථයේ සේවා සැපයීම සඳහා එක් වාරයකට ක්‍රියාකරු හා සහයක දීමනාව රු. 500 0 බැගින් අය කරනු ලැබේ.) | |
| 06. | පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ජල බවුසරය ලබා දීමේ දී ගාස්තුව | 1,500 0 |
| | - සෑම කි. මී. 01 ක් සඳහාම යාමට හා ඒමට ගාස්තුව | 90 0 |
| 07. | ඡායා පිටපත් සේවාව ලබා දීම | |
| | A4 ප්‍රමාණයේ තනි පැත්තක් ඡායා පිටපත් කිරීම සඳහා ගාස්තුව | 5 0 |
| | A4 ප්‍රමාණයේ දෙපැත්ත ඡායා පිටපත් කිරීම සඳහා ගාස්තුව | 8 0 |
| | Legal ප්‍රමාණයේ එක් පැත්තක් ඡායා පිටපත් කිරීමට ගාස්තුව | 8 0 |
| | Legal ප්‍රමාණයේ දෙපැත්ත ඡායා පිටපත් කිරීමට ගාස්තු | 10 0 |

06-120

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.